(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 120.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 සැප්තැම්බර් මස 07 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0995/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතියෙන් වරදකරුවන් බවට පත්වූ පුද්ගලයන්ට සමාවදීම සඳහා ජනාධිපතිතුමාට බලතල තිබේද;

(ii) එසේ නම්, පසුගිය වර්ෂ තුනක කාලසීමාව තුළ, එළෙස ජනාධිපතිතුමා විසින් සමාව ලබාදුන් පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එළෙස එම පුද්ගලයන් නිදහස් කිරීමට යොදාගත් පදනම කුමක්ද;

(iv) එළෙස නිදහස ලබාදුන් අවස්ථාව වනවිට එම එක් එක් පුද්ගලයා කොපමණ කාලයක් සිර දඬුවම් විඳ තිබුනේද;

(v) පසුගිය වර්ෂ තුනක කාලය තුළදී ජනාධිපතිතුමා විසින් සමාව ලබාදී නිදහස්කර යැවූ දේශපාලඥයින් හෝ ඔවුන්ගේ ඥාතීන්ගේ නම් කවරේද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1116/'11

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගුරු සේවයේ යෙදී සිටිය දී විදුහල්පතිවරුන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වී, සමත් වීමෙන් පසු විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය වූ විදුහල්පතිවරුන් කලින් සේවයට වඩා පහළ වැටුපක් ලබන බවත්;

(ii) එම හේතුව නිසා ඔවුන් දැඩි මානසික හා ආර්ථික අපහසුතාවයන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැඩි කැපවීමකින් පාසල් කළමනාකරණ කටයුතුවල නියුක්තව සිටින එම පිරිස මීට පෙර ගුරු සේවයේ දී ලැබූ වැටුප් තලයට වැඩි වැටුප් තලයක පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා මේ වන විට ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) නොඑසේ නම්, එවැනි ක්‍රමවේදයක් සකසනු ලබන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1161/'11

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ආලංකුඩා ප්‍රදේශයේ අක්කර 400 ක හෝ ඊට ආසන්න ප්‍රමාණයක රජය සතු ඉඩමක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉඩමේ පෙර අයිතිකරුවන් කවරුන්ද;

(ii) එම ඉඩම මේ වන විට කොටස් කර විකුණා හෝ බදු දී තිබේද;

(iii) රජය සතු එම ඉඩම එසේ විකිණීමට හෝ බදු දීමට අවසර ලබා දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් කවරුන්ද;

(iv) මෙම ඉඩම මිල දී ගත් හෝ බදු ගත් අයගේ නම් සහ එක් එක් පුද්ගලයාට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් ඉඩමේ වර්තමාන තත්ත්වය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1256/'11

4\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් අධිකරණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1605/'11

5\.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෝයා බෝංචි සහ බඩ ඉරිඟු නිෂ්පාදනය වැඩි කිරීම සඳහා විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවන ප්‍රදේශ කවරේද;

(iii) අදාළ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1117/'11

6\.
ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි පස්ගොඩ පවුල් සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වර්ෂ ගණනාවක සිට අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කොට ප්‍රදේශයේ ජනතාවට යහපත් සෞඛ්‍ය සේවාවක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ වනවිට වෙන් කර තිබේද;

(iii) එසේ වෙන් කර ඇති එම මුදල කොපමණද;

(iv) එම ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1129/'11

7\.
ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන භාණ්ඩ කවරේද;

(ii) එම එක් එක් භාණ්ඩ වර්ගයෙන් ආනයනය කරන ලද ප්‍රමාණය සහ එහි වටිනාකම කොපමණද;

(iii) එකී භාණ්ඩ ආනයනය කරනු ලැබූ ප්‍රධාන රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ආනයනයන් අධෛර්යමත් කිරීම සඳහා රජය විසින් කිසියම් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1178/'11

8\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව උපතේ සිට වර්ෂ පහ දක්වා දරුවන්ට කිරි මිලදී ගැනීම සඳහා මසකට රුපියල් 200/- බැගින් ලබා දීම සඳහා වර්ෂ 2005 සිට 2010 දක්වා රජය විසින් වියදම් කරන ලද මුදල වාර්ෂිකව කොපමණද;

(ii) 2011 වර්ෂය වනවිට එකී ප්‍රතිලාභ ලබන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2005 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂය වනවිට පවත්නා කිරි මිලෙහි වැඩිවීමත් සමඟ එකී දීමනාව වැඩි කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1257/'11

9.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1606/'11

10.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරේ නැවත පදිංචි කළ, අඩු ආදායම්ලාභීන් සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මකවේද;

(ii) එසේ නම්, එම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන උපරිම ණය මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1118/'11

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින තුළ මේ වනවිට පිහිටුවා ඇති ගුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2005 සිට 2010 දක්වා ගුරු මධ්‍යස්ථාන සඳහා දිස්ත්‍රික් මට්ටමින් වෙන් කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම මධ්‍යස්ථානවලින් සිදුවන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුරු මධ්‍යස්ථාන සඳහා කළමනාකරුවන් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(ii) එම තනතුර දැරීම සඳහා තිබිය යුතු සුදුසුකම් සහ ඔවුන්ට හිමි වරප්‍රසාද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට නියමිත බඳවා ගැනීමේ ක්‍රමවේදයෙන් පරිබාහිරව ගුරු මධ්‍යස්ථාන කළමනාකරු තනතුරට ගුරුවරුන් පිරිසක් අනුයුක්ත කර ඇති බවත්;

(ii) එම තනතුරට සුදුසුකම් නොමැති පුද්ගලයන් අනුයුක්ත කිරීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඇති කර ගත නොහැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) නියමිත සුදුසුකම් නොමැති කළමනාකරුවන් අනුයුක්ත කර ඇති ගුරු මධ්‍යස්ථාන සඳහා සුදුසුකම් සහිත කළමනාකරුවන් පත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1133/'11

12\.

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් සේවා සපයනු ලබන සමස්ත විදුලි පරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයෙන් සේවය ලබා ගන්නා පාරිභෝගිකයන් අතරින් ගෘහස්ථ, රජයේ ආයතන, කාර්මික ආයතන, ආගමික ආයතන සහ වෙනත් යන කාණ්ඩවලට අයත්වන පාරිභෝගික සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් පාරිභෝගික කාණ්ඩයේ විදුලි පරිභෝජන ප්‍රමාණය සමස්ත නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා වූ පසුගිය වර්ෂ තුනක කාලය තුළ ඉහත (අ)(ii) හි සඳහන් පාරිභෝගික කාණ්ඩවලින් අයකරන ලද විදුලිය සඳහා වූ ගාස්තු ප්‍රමාණයන් කවරේද;

(ii) ඉහත සඳහන් කාල සීමාව තුළ ගාස්තු ප්‍රමාණයන්හි වෙනස්කම් ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011 ජනවාරි මස සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය මසකට ලැබූ පාඩුව කොපමණද;

(ii) ඉහත සඳහන් විදුලි පාරිභෝගික කාණ්ඩ එකිනෙක මගින් ලංකා විදුලිබල මණ්ඩලය ලැබූ පාඩුවට දායක වී ඇති ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස හා තථ්‍ය වටිනාකම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1181/'11

13\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් තේ වතු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) ඉහත තේ වතු අතරින් පුද්ගලීකරණය සඳහා කටයුතු යොදා ඇති වතු සංඛ්‍යාව කොපමණද;

(iii) එම වතුවල නම් කවරේද;

(iv) එම වතු පුද්ගලීකරණය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පරිදි වතු පුද්ගලීකරණය මහින්ද චින්තන ප්‍රතිපත්ති යටතේ ජනතාවට වූ පොරොන්දු කඩ කිරීමක් බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1258/'11

14\.
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1607/'11

15\.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාත් උපාය මාර්ගික පාරිසරික ඇගයීම් වාර්තාවක් සකසනු ලැබුවේද;

(ii) උතුරු පළාතේ සිදු කෙරෙන කඩිනම් සංවර්ධන වැඩසටහන් සඳහා එම වාර්තාවෙන් ලබාගන්නා දායකත්වය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.00 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*2.

පරිසර අමාත්‍යතුමා,— ජාතික පාරිසරික පනත යටතේ නියෝග,— 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 32 (2) (ඌ) වැනි වගන්තිය යටතේ පාරිසරික සහ ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2009 නොවැම්බර් 10 දිනැති අංක 1627/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 1),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 ජූනි 29 දිනැති අංක 1660/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 2),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 3),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 4),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 5),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 1617/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 6),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2011 පෙබරවාරි 23 දිනැති අංක 1694/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*11.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*12.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*16.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*17.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*18.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*19.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*20.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*21.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*22.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

24.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

25.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0333/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම එක් එක් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ආණ්ඩුව සහ විපක්ෂය නියෝජනය කරමින් දැනට තේරී පත්වී සිටින මන්ත්‍රීවරුන්ගේ නම්, උපන් දිනයන් සහ දේශපාලන පක්ෂ කවරේද;

(iii) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට හිමි වරප්‍රසාද කවරේද;

(iv) ඉහත ආයතනයන්හි සේවය කරන සම්පූර්ණ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) වැටුප් සඳහා මසකට වැයවන සම්පූර්ණ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0841/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2006 වර්ෂයේ සිට මේ දක්වා රජයට අහිමි වී ඇති මුළු තීරුබදු ආදායම් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2009 වර්ෂයේදී වෙළඳ ගිවිසුම් හතරකින් පමණක් රජයට අහිමි වූ තීරුබදු ආදායම රුපියල් කෝටි 600කට ආසන්න බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එසේ නම්, එම ගිවිසුම් කවරේද;

(ii) එම ගිවිසුම් නිසා තීරු බදු ආදායම අඩුවීමට හේතු වූ කාරණා කවරේද;

(iii) එම තත්ත්වයන් මග හරවා ගැනීමට රජය ගන්නා වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0903/'10

3.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) අළුත්ගම, දර්ගා නගරය, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ අනුයුක්ත කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කරන එම්. ආර්. එම්. සිල්මි මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වැනි පන්තියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා 2000/11/05 දින සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ බවත්;

(ii) සුදුසුකම් සියල්ල සපුරා තිබුනත් කළුතර කලාප අධ්‍යාපන කාර්යාලයේ ඔහුගේ පෞද්ගලික ලිපි ගොනුව සම්පූර්ණ කර නොතිබීම සහ නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා ඒ මහතාට අපේක්ෂිත උසස්වීම නොලැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අංක 82/2000 සහ 2000/08/24 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීන්දුව අනුව උසස් වීම් ලැබීම සඳහා උපාධිලත් අනුයුක්ත කථිකාචාර්යවරයෙකු 2000/08/24 දිනට වසර 5ක සේවා කාලය සම්පූර්ණ කර තිබීමේ අවශ්‍යතාව, ශාස්ත්‍රපති උපාධිධාරියෙකු (M.A) වූ සිල්මි මහතා 2000/07/11 දිනය වන විටත් සම්පූර්ණ කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, සිල්මි මහතාට එකී උසස්වීම ලබා දීම තවදුරටත් ප්‍රමාද කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2000/12/08 දින සිට ක්‍රියාත්මකවන පරිදි සිල්මි මහතා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කොට, එම තනතුරට අදාළ වැටුප් තලය අනුව සියලු හිඟ වැටුප් සහ දීමනා නොපමාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0585/'10

4.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජය, 1970 - 1980, 1980 - 1990, 1990 - 2000 යන කාලසීමාවන්හිදී සම්පූර්ණයෙන් ලබා ගත් ණය මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ණය මුදල් බහු පාර්ශ්වීය ණය මුදල්ද; නොඑසේ නම් ද්විපාර්ශ්වීය ණය මුදල්ද;

(iii) ඉහත කී ණය මුදල් සඳහා අදාළවන පොලී අනුපාතිකයන් සහ වාර්ෂිකව ගෙවන ලද පොලී මුදල කොපමණද;

(iv) එකී ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිමකර තිබේද;

(v) ඉහත කී ණය මුදල් සඳහා ගෙවන ලද සම්පූර්ණ පොලිය සහ ප්‍රාග්ධන ක්‍රමක්ෂය වාර්ෂික පදනමින් කොපමණද;

(vi) දැනට ලබා ගෙන ඇති ණය සඳහා 2015 සිට 2020 දක්වා (වසර පහක) කාලසීමාව සඳහා ගෙවිය යුතු සමස්ත පොලිය සහ ප්‍රාග්ධන ක්‍රමක්ෂය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1131/'11

5.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ ශුද්ධ වටිනාකමේ තත්ත්වය කවරේද;

(ii) වෙළඳ ශේෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පසුගිය මාස 24ක කාලය තුළ, එක් එක් මාසයේදී ආනයන සහ අපනයන ශේෂයන් තුළින් ප්‍රකාශිත වෙළඳ පරිමාව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?